1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/07/01/03 | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.12. 12 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 04/2025**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>මූලික විමර්ශන රාජකාරී සඳහා පත් කරනු ලබන නිලධාරීන්ට ගෙවීම් කිරීම</u>

දකුණු පළාත් සභාව යටතේ පවතින ආයතනවල මූලික විමර්ශන සිදු කිරීම පිණිස පත් කරනු ලබන, සිය නිත්‍ය රාජකාරී ලෙස විමර්ශන රාජකාරී පැවරී ඇති නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2014 හි සහ 26/2025 හි දීමනා ගෙවිය නොහැකි බැවින් ද, ඇතැම් අවස්ථාවන්හි මුහුණ දීමට සිදු වන අවදානම් හේතුවෙන් විමර්ශන භාර ගැනීමට නිලධාරීන් මැලිකමක් දක්වන බැවින් ද, **මූලික විමර්ශන සඳහා පත් කරනු ලබන නිලධාරීන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ කාර්යභාරය අපක්ෂපාතී කිරීම අරමුණු කරගනිමින්** <u>මූලික විමර්ශන සිදු කිරීම සඳහා පත් කරනු ලබන නිලධාරීන්ට</u> අදාළ වන පරිදි සහ මතු සඳහන් කොන්දේසිවලට යටත්ව 2025.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දීමනා ගෙවීම් කිරීමටත්, <u>නිත්‍ය රාජකාරී ලෙස විමර්ශන රාජකාරී පැවරී ඇති නිලධරයින්ට</u> මතු සඳහන් දීමනාවෙන් 70% ක් පමණක් ගෙවීම් කිරීමටත් ගරු ආණ්ඩුකාරවර විසින් 2025.11.25 දිනැතිව අනුමැතිය ලබා දී ඇත.

| ඉටු කරන කාර්යය | දීමනාව | |
|---|---|---|
| | ද්විතීය/ තෘතීය මට්ටමේ නිලධරයෙකු | විධායක/ ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ නිලධරයෙකු |
| මූලික විමර්ශන වාර්තාව ඉදිරිපත් කිරීම | රු. 3,000.00 | රු. 4,000.00 |
| චෝදනා පත්‍ර කෙටුම්පත් පිළියෙල කර ඉදිරිපත් කිරීම | රු. 1,000.00 | රු. 1,000.00 |

<u>**කොන්දේසි**</u>

i. මූලික විමර්ශන නිලධාරීන් විසින් ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතියට අනුව ජ'නලයක් නඩත්තු කළ යුතු අතර, එම ජ'නලය අවසන් වාර්තාව සමඟ අදාළ බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. මූලික විමර්ශන වාර්තා සැකසීමට අදාළ දීමනා ලබා ගැනීම සඳහා මෙම ජ'නල සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. කිසියම් මූලික විමර්ශනයක් සඳහා එක්

නිලධරයෙකු වෙනුවට කමිටුවක් පත් කරන ලද්දේ නම් කමිටුවේ එක් එක් සාමාජිකයා විසින් වෙන් වෙන් ව මෙම ජ'නලය නඩත්තු කළ යුතු ය. එසේම කමිටුවේ සාමාජිකයින්ට වෙන් වෙන් වශයෙන් ඉහත දීමනා ලබා ගැනීමට ද හිමිකම පවතී. ;

ii. ඉහත දීමනා ලබා ගැනීමට නම් මූලික විමර්ශනය සඳහා නියම කර ඇති කාල සීමාව තුළ එකී විමර්ශනය අවසන් කර තිබිය යුතු අතර, විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට අදහස් කරන්නේ නම් චෝදනා පත්‍ර කෙටුම්පත නිම කර භාර දීම ද එම කාල සීමාව තුළ ම සිදු කර තිබිය යුතු ය. මූලික විමර්ශනය සඳහා දින නියම කිරීමේ දී සිද්ධිය පිළිබඳව මනා අවබෝධයකින් යුතුව සාධාරණ කාලයක් මූලික විමර්ශන නිලධරයා වෙත ලබා දීමට අදාළ බලධරයින් කටයුතු කළ යුතු ය. ;

iii. මූලික විමර්ශන නිලධරයා හෝ කමිටුව නිසි කාල කළමනාකරණයකින් යුතුව මූලික විමර්ශනයට දී ඇති කාලය තුළ එය කඩිනමින් නිම කළ යුතු ය. කිසියම් හේතුවක් මත මූලික විමර්ශනයක් සිදු කිරීම, <u>ලබා දුන් කාලයට වඩා ප්‍රමාද වූයේ නම්</u> එවැනි මූලික විමර්ශනයක වාර්තා වෙනුවෙන් පහත පරිදි දීමනා ලබා ගත හැකි ය.

| **නියමිත දිනට වඩා ප්‍රමාද වූ කාලය** | **ඉහත සඳහන් කර ඇති දීමනාවෙන් ගෙවිය යුතු ප්‍රතිශතය** |
|---|---|
| මාසයක් හෝ ඊට අඩු කාලයක් | 75 % |
| මාසයකට වැඩි සහ මාස 02 ක් හෝ ඊට අඩු කාලයක් | 60 % |
| මාස 03 කට වැඩි සහ මාස 03 ක් හෝ ඊට අඩු කාලයක් | 50 % |

iv. මූලික විමර්ශන නිලධරයෙකුට ඔහු රජයේ සේවයේ දරන තනතුර පදනම් කරගෙන ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ඉහත දීමනාවට අමතරව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් ඇති අතර, මාස 03 කට වැඩි කාලයක් ගත වී භාර දෙනු ලබන මූලික විමර්ශන වාර්තා සඳහා ඉහත සඳහන් දීමනා <u>නොගෙවිය යුතු ය</u>.

02. ඒ අනුව, ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය යටතේ වන සියලු ආයතන/උප කාර්යාල මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

**සුමිත් අලහකෝන්**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත. - දැ.ගැ.පි.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.පි.

දුරකථන : **091-49 44 007** ෆැක්ස් : **091-22 32 691** විද්‍යුත් තැපැල : **depoffinance7@gmail.com**

ඇමුණුම 1

## මූලික විමර්ශන නිලධරයෙකු විසින් පවත්වා ගත යුතු ජ'නලය

මූලික විමර්ශනය සිදු කරන නිලධරයාගේ නම :

මූලික විමර්ශන නිලධරයාගේ නිත්‍ය තනතුර :

සේවයකට අයත් වන්නේ නම් අදාළ වන සේවය :

වැටුප් පරිමාණය සහ දැනට ලබන වැටුප :

සම්බන්ධ කරගත හැකි දුරකථන අංක

ජංගම :

කාර්යාලය :

නිවස :

මූලික විමර්ශනය සඳහා පත් කිරීමේ යොමුව :

සිද්ධියට අදාළ ආයතනය :

ප්‍රධාන කාර්යාලයේ නොවන්නේ නම් අදාළ සිද්ධිය සිදු වූ උප කාර්යාලය :

| දිනය | ආරම්භක වේලාව | අවසන් කරන ලද වේලාව | ඉටු කරන ලද කාර්යය (භාණ්ඩ/ මුදල් පරීක්ෂා කිරීම, ලේඛන පරීක්ෂා කිරීම, සාක්ෂි සටහන් කර ගැනීම) | මුදල්/ භාණ්ඩ/ ලේඛන භාරව සිටි අයගේ අත්සන හෝ සාක්ෂි ලබා දුන් අයගේ අත්සන |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

ඉහත වේලාවන්හි දී ඉහත සඳහන් කාර්යයන් හි නිරත වූ බව ප්‍රකාශ කර සිටිමි.

............................
දිනය

..........................................................
මූලික විමර්ශන නිලධරයාගේ අත්සන